*සැ. යු.* - 2015.10.16 වැනි දින පළ වූ අංක 1,937 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,938- 2015 ඔක්තෝබර් මස 23 වැනි සිකුරාදා - 2015.10.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1812 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1814 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1815 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1822 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 නොවැම්බර් මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ඔක්තෝබර් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1811- B 80994- 5,402 (2015/10)
2 B 4 –

# බඩු බාහිරාදිය විකිණීම්

## දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - මිනුවන්ගොඩ

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද, රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2015.11.28 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් පාන්නන් වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර හෝ වෙන්දේසිය පැවැත්වෙන දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු යි.

රෙජිස්ට්‍රාර්වරයාගේ නිසි අවසරය ලබාගෙන 2015.11.28 වැනි දින පෙ. ව.8.30 සිට 9. 30 දක්වා වෙන්දේසියට නියමිත භාණ්ඩ පරීක්ෂා කළ හැක.

වෙන්දේසියේ දී මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා ඉල්ලුම්කරු විසින් වෙන්දේසි අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, සියලුම ගෙවීම් මුදලින් ම ගෙවිය යුතු ය. මේ සඳහා චෙක්පත් භාර ගනු නොලබන අතර, මිලදී ගත් භාණ්ඩ එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

වෙන්දේසි භාණ්ඩ ඉල්ලුම්කරුවන් හා ගැණුම්කරුවන් තම අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ජාතික හැඳුනම්පත හෝ වෙනත් පිළිගත හැකි හැදුනුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර, එසේ ඉදිරිපත් කිරීමට නොහැකි වන්නන්ට වෙන්දේසි භූමියට ඇතුල් වීමට අවසර දෙනු නොලැබේ.

අධිකරණය විසින් තබනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

ඩී. ඒ. රුවන් පතිරණ,<br>
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,<br>
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,<br>
මිනුවන්ගොඩ.

2015 සැප්තැම්බර් මස 29 වැනි දින,<br>
මිනුවන්ගොඩ, දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව

| *අනු. අංකය* | *නඩු අංකය* | *විස්තරය* |
|---|---|---|
| 01. | AR779/14 | ලි. ප. අංක රහිත එන්ජින් අංක 23 එච්. එම්. පී. කේ. එච්. දරන හොණ්ඩ යතුරු පැදි 01 (මෝ. පා. වා. අනුව චැසි අංක සී 50/0315276 එන්ජින් අංක සී 50 - ඊ 0315546 |
| 02. | AR 847/14 | ලි. ප. අංකයක් නොමැති එන්ජින් අංක චැසි අංක වෙස් කර ඇති බව කියන වැලි වර්ගයේ යතුරු පැදි 01 (මෝ. ර. ප. අනුව චැසි අංක සීඑෆ් 50/2503691 එන්ජින් අංක එෆ් 50 ඊ - 2503509) ලියාපදිංචි කළ නොහැක. |
| 03. | AR 848/14 | ලි. ප. අ. 119-6814 දරන කොළ පාට යමහා වර්ගයේ යතුරු පැදි 01 (මෝ. රා. ප. වා අනුව චැසි අංක වී 50-447817 එන්ජින් අංක වී 50 - 447817) |
| 04. | AR 849/14 | ලි. ප. අ. 103 - 9270 දරන හොණ්ඩා වර්ගයේ යතුරු පැදි 01 (මෝ. රා. ප. වා. අනුව චැසි අංක සී 90- 3107547 එන්ජින් අංක සී 50 - ඊ - 6031820 |
| 05. | AR 850/14 | ලි. ප. අංක රහිත චැසි අංක සී. බී. 125 ටී. 1006325 හා එන්ජින් අංක සී බී 125 ටී. ඊ. 1006335 දරන හොණ්ඩා සී බී 125 වර්ගයේ යතුරු පැදි 01 |
| 06. | AR 1613/14 | ලි. ප. අ. 150 - 5010 දරන යමහා වර්ගයේ යතුරු පැදි 01 (මෝ. රා. ප. වා. අනුව චැසි අංක 2 ආර්එම් 002463, එන්ජින් අංක : 2 ආර්එම් - 0024463) |
| 07. | AR 1614/14 | ලි. ප. අ. 125 - 0690 දරන හොණ්ඩා වර්ගයේ යතුරු පැදි 01 (මෝ. රා. ප. වා අනුව චැසි අංක සීබී 125 ජේ - 1051729 එන්ජින් අංක සීබී 125 ජේ - 1052595) |
| 08. | E 41302 | අංක තහඩු නොමැති එන්ජින් අංක එම්ඩී 90ඊ1735108 හා චැසි අංක අපැහැදිලි හොණ්ඩා වර්ගයේ රතුපාට යතුරු පැදි 01 (මෝ. රා. ප. ව. අනුව චැසි අංක එම්ඩී 90-17** 2114 එන්ජින් අංක එම්ඩී 90ඊ 1735108) |
| 09. | AR 720/13 | මවුන්ටන් වර්ගයේ කහපාට පාපැදි 02 |
| 10. | AR 870/14 | අංක සී 5682 දරන ලුමාලා වර්ගයේ පාපැදි 01 |
| 11. | AR 745/14 | වර්ගය සඳහන් නොමැති අංක පි පී 17396 දරන පාපැදි 01 |
| 12. | P. 86153 | කුඩා බැටරි චාජර් 01 |
| 13. | P. 84932 | පෝම් වර්ගයේ කළු පාට ජංගම දුරකථන 01 |
| 14. | P. 82453 | ඒ. ජී. ටෙල් වර්ගයේ ජංගම දුරකථන 01 |
| 15. | P. 82183 | මයික්‍රො මැක්ස් වර්ගයේ ජංගම දුරකථන 01 |
| 16. | P. 82520 | ඒ. ජී. ටෙල් වර්ගයේ ජංගම දුරකථන 01 |
| 17. | E.47692 | ඇලුමිනියම් මුට්ටි 01 |
| 18. | PC.30618 (බී263/11) | (i) ඇලුමිනියම් කළගෙඩි 01<br>(ii) බේසම් 01<br>(iii) ප්ලාස්ටික් මිට සහිත පිහියා 01<br>(iv) යකඩ ඉනි 01<br>(v) කිඹුලා උදලු තල 01<br>(vi) මෝටර් රෝලා වර්ගයේ ජංගම දුරකථන 01<br>(vii) ජනහිත වෙළඳ නාමය සහිත තඹ තහඩු 50 බැගින් වූ පෙට්ටි 02 තඹ තහඩු 49ක් අඩංගු පෙට්ටි 01 |
| 19. | P.70835 | (i) උදලු තල 01<br>(ii) සවල් 01 |
| 20. | P.71140 | යකඩ කූරු 01 |
| 21. | P.71141 | කුළුගෙඩි 01 |
| 22. | P.71142 | කුළුගෙඩි 01 |

| අනු. අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| 23. | P.71344 | කුළුගෙඩි 01 |
| 24. | P.72395 | කුළුගෙඩි 01 |
| **25.** | P.72396 | කුළුගෙඩි 01 |
| 26. | P.72522 | අලවංගු 01 |
| 27. | P.72527 | කුළුගෙඩි 01 |
| 28. | P.72528 | යකඩ ඉනි 01 |
| 29. | P.72529 | යකඩ ඉනි 01 |
| 30. | P.72530 | යකඩ තාච්චි 01 |
| 31. | P.72531 | යකඩ ඉනි 01 |
| 32. | P.72532 | යකඩ ඉනි 01 |
| 33. | P.72668 | යකඩ ඉනි 01, කුලු ගෙඩි 01 |
| 34. | P.73154 | යකඩ කුරු 01 |
| 35. | P.73156 | යකඩ තාච්චි 01 |
| 36. | P.73243 | කුලුගෙඩි 01 |
| 37. | P.77377 | (i) උදලු 02, සවල් 01 |
| 38. | P. 85197 | උදලු 01 |
| 39. | P. 85359 | උදලු 01 |
| 40. | P.85437 | උදලු 01 |
| 41. | P.85488 | සවල් 01 |
| 42. | P.85797 | (i) සවල් 01 |
| 43. | P.72397 | කුළුගෙඩි 01 |
| 44. | P.85796 | කුළුගෙඩි 01 |
| 45. | P.85436 | යකඩ හැමර් 01, බෝරකටු 03 |
| 46. | P.85776 | (i) උදලු 01, 2. සවල් 02, 3. බාල්දි 02 |
| 47. | P.85819 | සවල් 01 |
| 48. | P.85719 | උදලු 01 |
| 49. | E.96064 | (i) අංක 1178 දරන පාට සෙල්ගෑස් සිලින්ඩර් 01 |
| | | (ii) රෙගියුලේටර් සහිත ගෑස් ලිප් 01 |
| 50. | E.24225 | (i) ගෑස් සිලින්ඩර් 01 |
| | | (ii) ගෑස් ලිප් 01 |
| | | (iii) ඇලුමිනියම් මුට්ටි 01 |
| 51. | E.47835 | (i) ගෑස් සිලින්ඩර් 02 |
| 52. | AR746/14 | (i) අතින් ක්‍රියා කරන ඔකේස්වර්ගයේ ගෑස් ලාම්පු 01 |
| | | (ii) එම වර්ගයේ කුඩා ගෑස් ටැංකි 01 |
| 53. | PC.31598 (බී 1312/11) | වාහන සිග්නල් ලයිට් සෙට් 01 |
| 54. | P.86138 | කටර් අඬු 01 |
| 55. | PC 8177 (බී 429/8) | (i) පිත්තල පහන් කොටස් 03 |
| | | (ii) හුලංකොකු 03 |
| 56. | PC 98803 (බී 906/6) | රබර්සීට් කිලෝ 28යි |
| 57. | PC 8456 (බී 596/8) | පිත්තල යතුරු තහඩු 01, සරනේරු 04, සොයිබ 03 |
| 58. | PC 24140 (බී 937/11) | (i) යකඩ ඇණ කිලෝ 01 |
| | | (ii) යකඩ බාල්දි 02 |
| 59. | PC 29229 (බී 1179/11) | ජිනසේන වර්ගයේ වතුර මෝටර් 01 |
| 60. | PC 85318 | ප්ලාස්ටික් පැදුරු 02 |
| 61. | PC 37360 (බී. 928/11) | (i) පාවිච්චි කරන ලද කහ, දුඹුරු සුදු හා නිල් පැහැති සාරි 07 |
| | | (ii) සුදු කළු හා දුඹුරු පැහැති ඇඳ ඇතිරිලි 01 |
| | | (iii) සුදු පැහැති වේට්ටි 02 |
| | | (iv) පිත්තල ලාම්පු 02 |
| | | (v) පිත්තල ස්ත්‍රික්ක 01 |

| අනු. අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| 62. | AR745/15 | (i) කොළ පාට හා දම් පාට තුවා 26ක් අඩංගු පෙට්ටි 01 |
| | | (ii) නිල්පාට තුවා 34ක් අඩංගු පෙට්ටි 01 |
| | | (iii) රෝසපාට තුවා 25ක් අඩංගු පෙට්ටි 01 |
| | | (iv) රෝස පාට තුවා 10ක් අඩංගු පෙට්ටි 01 |
| | | (v) රෝස පාට තුඩා 45ක් අඩංගු පෙට්ටි 01 |
| | | (vi) දම් පාට තුවා 45ක් අඩංගු පෙට්ටි 01 |
| | | (vii) දම් පාට තුවා 45ක් අඩංගු පෙට්ටි 01 |
| | | (viii) පිටු 160 තනිරූල් පොත් 02 බැගින් අඩංගු පාර්සල් 85ක් අඩංගු පෙට්ටි 01 |
| | | (xi) පිටු 160 තනිරූල් පොත් 03 බැගින් අඩංගු පාර්සල් 11ක් අඩංගු පෙට්ටි 01 |
| 63. | E 50034 | (i) ලිත්රෝ වර්ගයේ ගෑස් සිලින්ඩර් 01 |
| | | (ii) සෙල් වර්ගයේ ගෑස් සිලින්ඩර් 01 |
| | | (iii) කානු 4 යකඩ ලිප් 01 |
| | | (iv) ආපිටෙක් වර්ගයේ වතුර මෝටර් 01 |
| | | (v) හම් බූට් ජෝඩු 01 |
| 64. | E 85944 | (i) සවල් 01, 2. උදලු 01 |
| 65. | E 33891 | (i) ගෑස් සිලින්ඩර් 01, 2. ගෑස් ලිප් 01 |
| 66. | E 52450 | (i) ගෑස් සිලින්ඩර් 01, 2. ගෑස් ලිප් 01 |
| 67. | AR 339/11 | (i) පාපැදි 01 |
| 68. | ඒආර්343/11 | (i) පාපැදි 01 |
| 69. | 73819 / 188/11 | බාල්දි 01 |
| 70. | 77627 / 25/12 | යකඩ බාල්දි 3, සවල් 01 |
| 71. | 80192 / 265/13 | හිල් බාල්දි 01 |
| 72. | 75485 / 146/12 | බාල්දි 01, උදලු 01, සවල් 01 |
| 73. | 74891 / 169/11 | බාල්දි 01 |
| 74. | පී 74924 | සවල් 01 |
| 75. | ඊ 75808 | ගෑස් ලිප් 01 |
| 76. | 83760 | බාල්දි 01 |
| 77. | 78824 | සවල් 01 |
| 78. | අංක රහිත | සවල් 02 |
| 79. | අංක රහිත | දිග අඩි 18ක් පමණ වන යකඩ කම්බි කුරු 40 |

**2014 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ**

| | | |
|---|---|---|
| 80. | බංකු (හේත්තුවන) | 04 |
| 81. | බංකු (සාමාන්‍ය) | 02 |
| 82. | ලී බන්දේසි | 10 |

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

වහුගපිටිය රා තැබෑරුම් රේන්දය නැවත විකිණීම - 2016 වර්ෂය

2016 වර්ෂයට අදාලව 2015.08.25 වැනි දින උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පවත්වන ලද වහුගපිටිය රා තැබෑරුම් රේන්දය විකිණීමේ කටයුත්තේ දී ටෙන්ඩර් මණ්ඩලය සෑහීමකට පත්වන ආකාරයෙන් ටෙන්ඩර් ඉල්ලුම්පත් ඉදිරිපත් නොවීම හේතුවෙන් වහුගපිටිය රා තැබෑරුම් රේන්දය නැවත විකිණීමට සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් තීරණය කර ඇති අතර ඊට අදාළ නිවේදනය හා කොන්දේසි පහත දක්වා ඇත.

1982 වර්ෂයේ අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය සහ ඊට පසු කාල පරිච්ඡේදය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත් ව, 2016 වර්ෂය තුළ රා සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිලට ගැනීම සඳහා උඩපළාත ප්‍රාදේශීය ලේකම්තැන වන මා විසින් 2015.11.11 වැනි දින පෙ. ව. 10.30 තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නිසි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර,

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ; සහ

*(ආ)* ටෙන්ඩර්කරුවන්ගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ නිශ්චිත දේපළ පිළිබඳ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන්, සම්බන්ධයෙන් විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය :-

(i) ටෙන්ඩර් පත්‍ර මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍ර පෝරමවල නියමිත සාක්ෂිකරුවන් අත්සන් යොදා තිබිය යුතු ය;

(iii) සෑම වෙනස් කිරීමක්, කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය.

03. මෙහි නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

විධිමත්ව සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර -

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබා ගන්නා ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කුවිතාන්සියක්, සහ

*(ආ)* වත්කම් සහතිකයක් සමග
ලියුම් කවරයක බහා ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවර තැබෑරුමේ අංකය සහ නම සඳහන් කර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් කිරීමට ප්‍රථම තැන්පත් කළ යුතු යි. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත්වීමට ප්‍රථමයෙන් උඩපළාත ප්‍රාදේශීය ලේකම්තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් එක් රේන්දයක් වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇත. එකී වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩරයක් ඉදිරිපත් කර ''වරප්‍රසාදය මිලදී ගත් තැනැත්තා'' යැයි ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින ප. ව. 2.30 ට පෙර උඩපළාත ප්‍රාදේශීය ලේකම්තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කොට යට කී රා රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදල්වලින් හෝ බැංකුවකින් 'ගෙවීම් සඳහා' සලකුණු කර චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පත් නමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතු ය.

06. වැඩි විස්තර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා දැනගත හැකිය.

යූ. පී. ඉන්දික අනුරුද්ධ පියදාස,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත -ගම්පොළ.

2015 සැප්තැම්බර් මස 30 වැනි දින,
උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

***2016 වර්ෂය සඳහා ගම්පොල උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කරන ලද වහුගපිටිය රා තැබෑරුම පිළිබඳ විස්තර***

| | *අනු. අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කර තබන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|---|---|
| 01. | වහුගපිටිය රා තැබෑරුම | උඩපළාත | වහුගපිටිය ගම තුළ | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2015.11.11 වැනි දින පෙ. ව. 10.30 දක්වා | 1,500 |

10-741

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2015 ඔක්තෝබර් මස 01 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ප්‍රබෝධා ඩයග්නෝස්ටික් සර්විසස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 108788
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : පණ්ඩුකාභය මාවත, අම්පාර

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

10-720

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : කැනන්ගාසොෆ්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 89487
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 64, හයිලෙවල් ප්ලාසා, දෙල්කඳ

සමාගම් ලේකම්.

10-721

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : චිලි හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 108664
ලියාපදිංචි ලිපිනය : අංක 31/1, නුවර පාර, ගල්තොටමුල්ල, යක්කල

සට්ටම්බි රාළලාගේ දෙන් ජානක සජීව,
අධ්‍යක්ෂ.

10-723

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) යටතේ නිවේදනය

සුගෝයි ඉන්ටර්නැෂනල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් 2015.07.28 වැනි දින අංක පී වී 107379 යටතේ සංස්ථාගත කරන ලදී.

ලියාපදිංචි ලිපිනය : අංක 90H, IDH පාර කොටිකාවත්ත, අංගොඩ.

එම්. එන්. කේ. ප්‍රොෆෙෂනල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

10-731

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) යටතේ නිවේදනය

විවා ලා ග්‍රෑම් (ප්‍රයිවට්) ලිමිටඩ් 2015.06.04 වැනි දින අංක පී වී 106069 යටතේ සංස්ථාගත කරන ලදී.

ලියාපදිංචි ලිපිනය : අංක එස්, 23 - 4 වන මහල, කොළඹ, ගෝල්ඩ් සෙන්ටර්, කොළඹ 11.

10-732

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) යටතේ නිවේදනය

සමාගමේ නාමය : විවා ලා ග්ලෑම් (ප්‍රයිවට්) ලිමිටඩ්

ලියාපදිංචි දිනය : 2015.08.11
ලියාපදිංචි අංකය : පී වී 107645
ලියාපදිංචි ලිපිනය : අංක 5 - 23, 1 වන මහල, කොළඹ, ගෝල්ඩ් සෙන්ටර්, කොළඹ 11

එම්. එන්. කේ. ප්‍රොපෙෂනල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

10-733

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : මීසාන් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 83296
ලියාපදිංචි කාර්යාලය : 23 ඒ, ජයවර්ධන ඇවනිව්, දෙහිවල
සංස්ථාගත කළ දිනය : 2011.12.22

ඉබ්‍රාහිම් මොහොමඩ් අශ්රෆ්,
අධ්‍යක්ෂ/ලේකම්.

10-742

---

### සමාගමේ නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තියේ ප්‍රකාරව පහත නම් සඳහන් සමාගමේ නාමය වෙනස් කළ බව මෙයින් දැනුම් දෙමු.

පෙර සමාගම් නාමය : හේල් ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
නව සමාගම් නාමය : ෆයින්ඩ්මයි ෆෙයාර් හොලිඩේස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 77622
ලියාපදිංචි ලිපිනය : අංක 26 ඒ, ජයා පාර, බම්බලපිටිය, කොළඹ 04
නාමය වෙනස් කළ දිනය : 2011 අගෝස්තු 5 වැනිද

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

10-754

---

### නිවේදනයයි

පහත සඳහන් සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියට අනුව සංස්ථාපනය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : පී ඇන්ඩ් එස් ග්ලෝබල් සප්ලයර්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 108092
ලියාපදිංචි කළ දිනය : 2015 සැප්තැම්බර් 02
ලියාපදිංචි ලිපිනය : අංක 771/3, ලුතිනන් කර්නල් සුමිත් ධම්මික මාවත, බත්තරමුල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-763

## නිවේදනයයි

මෙම සමාගම 2008.06.24 වැනි දින සංස්ථාපිත කළ බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : නෙප්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 64574
සමාගම ලියාපදිංචි කළ දිනය : 2008.06.24
ලියාපදිංචි කාර්යාලය : අංක පී 94, ඕල්කට් මාවත, කොළඹ 11

මුහන්දිරමලාගෙදර අබ්දුල් සලාම්
රනාස් මොහොමඩ්,
ලේකම්.

අංක 10/1, පත්ගොල්ලාමඩ,
රතුකොහො දිගල,
අකුරණ, මහනුවර.

10-774

---

## ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 410/113 හි පදිංචි චන්ද්‍ර ජයම්පත් ගුණසේකර (ජාතික හැඳුනුම්පත් අංක 673 660 380 වී) සහ කාංචනා විදර්ශනී රත්නපාල (ජාතික හැඳුනුම්පත් අංක 735 941 771 වී) වන අප දෙදෙනා කෙටි කාලයක් සඳහා විදේශ ගත වූ බැවින් ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ටී. ඒ. සූරවීර මහත්මිය විසින් ලියා සහතික කරන ලද 2014.09.18 දිනැති හා අංක 1121 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් එහි සඳහන් බලතල කොළඹ 05, කිරුළපන, පොල්හේන්ගොඩ පාර අංක 218/1 හි පදිංචි මහමේන්ද්‍ර බාලසූරියගේ චාමෙර මුදිත කැලුම් ගුණසේකර (ජාතික හැඳුනුම්පත් අංක 742 360 083 වී) යන අයට පවරන ලදී. ඉහත සඳහන් කරන ලද ඇටෝර්නි බලපත්‍රය යටතේ පවරන ලද බලතල නැවත අප දෙදෙනා ලංකාවට පැමිණ ඇති බැවින් අවලංගු කොට අහෝසි කරන බවත්, මින් මතු එකී ඇටර්නි බලපත්‍රයට කිසිදු නිත්‍යානුකූල වගකීමක් නොමැති බවත්, ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් සාමාන්‍ය ජනතාවටත් දැනුම් දෙමි.

චන්ද්‍ර ජයම්පත් ගුණසේකර,
සහ
කාංචනා විදර්ශනී රත්නපාල.

10-775

---

## දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 9 (1) අනුව 2015.09.16 වැනි දින පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : එම්. එම්. ජී. එස්. ආකිටෙක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 108426
ලියාපදිංචි ලිපිනය : 26 ඒ, අල්විස් පෙදෙස, කොළඹ 03.

අධ්‍යක්ෂ.

10-804

---

## දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 9 (1) අනුව 2009.06.05 වැනි දින පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : නිව් රෝයල් ඉලෙක්ට්‍රිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 68014
ලියාපදිංචි අංකය : පී වී 68014
ලියාපදිංචි ලිපිනය : 604, ස්ටේෂන් පාර, හුණුපිටිය, වත්තල,

අධ්‍යක්ෂ.

10-805

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 61) වගන්තිය යටතේ දැන්වීම

සමාගමේ නම : සීමාසහිත කූල් මැක්ස් ෆැෂන් (පුද්ගලික)
සංස්ථාපිත අංකය : පී වී 108242
සංස්ථාපනය කරන ලද දිනය : 2015.09.08
ප්‍රධාන කාර්යාලය : අංක 46 බී/5, නුවර පාර, වරකාමුර.

ලේකම්.

10-812

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කේ. ජී. එන්. එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, 2015 ඔක්තෝබර් මස 05 වැනි දින සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : කේ. ජී. එන්. එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම
ලියාපදිංචි අංකය : පී වී 108843
ලියාපදිංචි ලිපිනය බණ්ඩාරනායක මාවත, පදවිය, අනුරාධපුරය

අබුබකර් ඒ, ගානී,
සමාගම් ලේකම්.

10-837

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : ෆාරා කොමර්ෂල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 108608
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 266/26, දෙමටගොඩ පාර, කොළඹ 09
සංස්ථාගත කළ දිනය : 2015.09.25
අධ්‍යක්ෂ : එම්. එෆ්. එම්. රිzස්වාන්.

10-841

**2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

සමාගමේ නම : ට්‍රේඩ් මේඩ් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 80954
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 2/12, හෝකන්දර පාර, කලල්ගොඩ, පන්නිපිටිය
සංස්ථාගත කළ දිනය : 2011.08.29
අධ්‍යක්ෂ : එම්. පී. එස්. හෙට්ටිආරච්චි.

10-842

---

**ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී, ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී සමග ඒකාබද්ධ කිරීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (3) වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී (ලියාපදිංචි අංකය පීකිව් 233) සහ ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී (ලියාපදිංචි අංකය පීබී 633 පීකිව්) යන සමාගම් ද්විත්වය එක සමාගමක් ලෙස ඒකාබද්ධ කරන ලද බවත්, ඊට අනුගාමීව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී සමාගම ඒකාබද්ධ ආයතනය ලෙස හැඳින්වෙන බවත් දන්වමු. මෙම ඒකාබද්ධ කිරීම 2015 ඔක්තෝබර් මස 01 දින සිට බලපැවැත්වෙන අතර ඒකාබද්ධිත සමාගමේ ලියාපදිංචි ලිපිනය, කොළඹ 03, ගාලු පාර, අංක 73/5 වශයෙන් දක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

10-815

---

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර මෙසේ නිවේදනය කරනු ලැබේ**

සමාගමේ කළින් තිබූ නාමය : සදර්න් මර්චන්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 74738,
ලියාපදිංචි ලිපිනය : අංක 160/22, කෙලින් වීදිය, ගනේහේන, බත්තරමුල්ල
සමාගමේ නව නාමය : මයි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (පීවීටී) එල්ටීඩී
නම වෙනස් කළ දිනය : 2015.08.25

ගෙස්ට්මන් කෝපරේට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

10-845

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි

සමාගම් නාමය : එල් එම් ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 108531
ලියාපදිංචි කළ දිනය : 2015.09.23
කාර්යාල ලිපිනය : අංක 291/32 ඒ, හැව්ලොක් පාර, කොළඹ 05.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 291/32 ඒ,
හැව්ලොක් උද්‍යානය,
හැව්ලොක් පාර,
කොළඹ 05.

10-847

---

**ප්‍රසිද්ධ නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සමාගම් පිහිටුවීම සම්බන්ධ වූ නිවේදනයයි

සමාගමේ නම : ජැක් ලංකා හොලිඩේස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 106078
ලියාපදිංචි ලිපිනය : අංක 93/18, පල්ලිය පටුමග, පෙරියමුල්ල, මීගමුව
ලියාපදිංචි දිනය : 2015.06.04

සමාගමේ නම : එෆ්. ඒ. සිලෝන් ස්පයිසස් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 108597
ලියාපදිංචි ලිපිනය : අංක 539/බී 2, මහගෙදරවත්ත, නුගදූව, ගාල්ල
ලියාපදිංචි දිනය : 2015.09.23

සමාගම් ලේකම්.

10-867

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

හික්කඩුව, මිල්ල, බරනිගෙවත්ත හි පදිංචි අරුමාහන්දි කුලේෂ්වර චන්දන බර්ජිත් පියසේන ද සිල්වා වන මම ඉතලියේ, රෝම, ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අත්සන් තබන ලද 2012.01.08 වැනි දින දරන විදේශ ඇටෝර්නි බලපත්‍රය මගින් හික්කඩුව, මිල්ල, බරනිගෙවත්ත අංක 364 හි පදිංචි අරුමාහන්දි ප්‍රියන්ති බිෂේල් ක්‍රිෂ්ණා ද සිල්වා යන අයට පවරන ලද ඇටර්නි බලය මෙයින් අවලංගු කරන අතර එකී ඇටර්නි බලපත්‍රය මත කිසිදු කාර්යයක් මින් මතු වලංගු නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට මෙයින් දැනුම් දෙනු ලැබේ.

අරුමාහන්දි කුලේෂ්වර චන්දන
බර්ජිත් පියසේන ද සිල්වා,
(දීමනාකරුගේ නම)

2015 ක් වූ ඔක්තෝබර් මස 01 වැනි දින දී ය.

10-869/1

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

හික්කඩුව, මිල්ල, බරනිගෙවත්ත හි පදිංචි අරුමාහන්දි කුලේෂ්වර චන්දන බර්ජිත් පියසේන ද සිල්වා වන මම ටී. එච්. තුෂාර ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් තැන සහතික කළ අංක 877 හා 2008.04.19 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මගින් හික්කඩුව, තිරාණගම, ''චන්ද්‍රා නිවස'' හි පදිංචි හික්කඩුව පල්ලිය ගුරුගේ මනෝජා රෝෂණී දමයන්ති යන අයට පවරන ලද ඇටර්නි බලය මෙයින් අවලංගු කරන අතර එකී ඇටර්නි බලපත්‍රය මත කිසිදු කාර්යයක් මින් මතු වලංගු නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට මෙයින් දැනුම් දෙනු ලැබේ.

අරුමාහන්දි කුලේෂ්වර චන්දන
බර්ජිත් පියසේන ද සිල්වා,
(දීමනාකරුගේ නම)

2015 ක් වූ ඔක්තෝබර් මස 01 වැනි දින දී ය.

10-869/2

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීමේ නිවේදනය පහත දැක්වෙන පරිදි මෙහි දක්වා ඇත.

සමාගමේ නාමය :ආර්පිකෝ ඩේලි රිටේල් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 107320
ලියාපදිංචි ලිපිනය : අංක 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම
සංස්ථාගත කළ දිනය : 2015.07.27

රිචඩ් පීරිස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

10-870/1

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීමේ නිවේදනය පහත දැක්වෙන පරිදි මෙහි දක්වා ඇත.

සමාගමේ නාමය : ආර්පිකෝ හයිඩ් පාර්ක් ටවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102569
ලියාපදිංචි ලිපිනය : අංක 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම
සංස්ථාගත කළ දිනය : 2015.01.08

රිචඩ් පීරිස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

10-870/2

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීමේ නිවේදනය පහත දැක්වෙන පරිදි මෙහි දක්වා ඇත.

සමාගමේ නාමය : ආර්පිකෝ මෝටර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 106650
ලියාපදිංචි ලිපිනය : අංක 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම
සංස්ථාගත කළ දිනය : 2015.06.29

රිචඩ් පීරිස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

10-870/3

---

### සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ පහත සඳහන් සමාගමේ නම වෙනස්කළ බව මෙයින් දන්වමු.

පෙර නාමය : කන්සෝටියම් ඔෆ් හියුමැනිටේරියන් ඒජන්සීස් (ගරන්ටි) ලිමිටඩ්
නව නාමය : සෙන්ටර් ෆෝ හියුමැනිටේරියන් එෆයාර්ස් (ගරන්ටි) ලිමිටඩ්
සමාගමේ අංකය : ජීඑල් 06
ලියාපදිංචි ලිපිනය : 1, ගවර් වීදිය, කොළඹ 05
ලියාපදිංචි කළ දිනය : 2015 සැප්තැම්බර් මස 18.

ලේකම්.

10-874

---

### ඇටෝර්නි බලය අහෝසි කිරීම

කොළඹ 03, කොල්ලුපිටිය, ශාන්ත අන්තෝනි මාවත, අංක 85/14 දරන ස්ථානයෙහි පදිංචි සෙල්ලයියා රාජ්මොහාන් වන මම මා විසින් රාජගිරිය, බත්තරමුල්ල පාර, ෆෙයාමවුන්ට් රෙසිඩන්සීස් අංක 37 - 24 බී දරන ස්ථානයෙහි පදිංචි ඩිල්ෂාන් නෙරියුස් රොජර් ප්‍රනාන්දු යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් ආනන්ද කුලවංශ මහතා විසින් ලියා සහතික කරන ලද අංක 886 සහ 2014.08.07 දින දරන ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2015 ඔක්තෝබර් මස 08 වැනි දින පටන් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කළ බව මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙන අතර, වර්ෂ 2015 ඔක්තෝබර් මස 08 වැනි දින සිට එකී ඩිල්ෂාන් නෙරියුස් රොජර් ප්‍රනාන්දු යන අය මා වෙනුවෙන් ඇතුලත් වන කිසිදු ගිවිසුමක් වෙනුවෙන් මා කිසිදු වගකීමක් නොදරන බව මෙයින් දැනුම් දෙමි.

සෙල්ලයියා රාජ්මෝහන්.

2015 ඔක්තෝබර් මස 08 වැනි දින දී ය.

10-878

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර, පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : බී ඇන්ඩ් ඊ ක්ලෝතිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2015.09.28
සමාගමේ අංකය : පී වි 108674
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 74, තිඹිරිගස්යාය පාර, කොළඹ 05

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

පී. ඊ. චම්පික රූද්‍රිගෝ, 077 2205857,
සමාගම් ලේකම්.

10-882

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර දැන්වීම.

සමාගම් නාමය : සෙනිත් එක්ස්පෙඩිෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 108279
ලියාපදිංචි සමාගමේ ලිපිනය : අංක 137/7, නාගහවත්ත පාර, මහරගම
ලියාපදිංචි කළ දිනය : 2015 සැප්තැම්බර් 9

සමාගම් ලේකම්.

10-883

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙසේ නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ග්‍රැවිටි ඉන්ටිග්‍රේටඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 105225
සංස්ථාගත කළ දිනය : 2015 අප්‍රේල් 23
ලියාපදිංචි ලිපිනය : අංක 16/20, ගෝල්ෆේස් කෝට් 2, කොළඹ 3.

සමාගම් ලේකම්.

10-885

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙසේ නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සිවිල් ඇන්ඩ් ස්ට්‍රක්චරල් ඉංජිනියරින් කන්සල්ටන්ට්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 105562
සංස්ථාගත කළ දිනය : 2015 මැයි 12
ලියාපදිංචි ලිපිනය : අංක 772 ඒ, විජේසිංහ මාවත, මාදින්නාගොඩ, රාජගිරිය.

සමාගම් ලේකම්.

10-886

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙසේ නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : අයෝරා ඉන්වෙස්ට්මන්ට් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 107065
සංස්ථාගත කළ දිනය : 2015 ජූලි 15
ලියාපදිංචි ලිපිනය : අංක 78 3/1, තැපැල් කාර්යාල පාර, හාලිඇල.

සමාගම් ලේකම්.

10-887

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : සිල්ක් රෝඩ් රිටේලර්ස් (පීවීටී), එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 108309
ලියාපදිංචි දිනය : 2015 සැප්තැම්බර් 10
ලිපිනය : අංක 110, හීරස්සගල පාර, නුවර.

සමාගම් ලේකම්වරු.

10-916/1

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : විමරීන් ඉන්ටර්නැෂනල් (පීවීටී), එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 107358
ලියාපදිංචි දිනය : 2015 ජූලි 28
ලිපිනය : 50/1, ශ්‍රී සිද්ධාර්ථ පාර, කිරුළපන, කොළඹ 05.

සමාගම් ලේකම්වරු.

10-916/2

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : සී කේ හෝම්ස් (පීවීටී), එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 107302
ලියාපදිංචි දිනය : 2015 ජූලි 24
ලිපිනය : අංක 292/1, මාවරමන්ඩිය පාර, මාකොළ උතුර.

සමාගම් ලේකම්වරු.

10-916/3

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : තැප්රොබේන් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 108673
සංස්ථාගත කළ දිනය : 2015.09.28
ලියාපදිංචි ලිපිනය : 202/ඩී/08, දික්හේනවත්ත, ගම්මාන පාර, කුඩාමාදූව, මත්තේගොඩ.

සමාගම් ලේකම්.

10-938

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2015 ඔක්තෝබර් මස 06 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ක්වරි මයිනිං සොලූෂන්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 108533
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 134 1/1, හැව්ලොක් පාර, කොළඹ 05

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස්
(පුද්ගලික) සමාගම.

10-924

---

### දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරමු.

සමාගමේ නම : කැලණි එක්ස්ටර්නල් ඩිග්‍රී ඉන්ස්ටිටියුට් (පීවීටී) එල් ටී ඩී
ලියාපදිංචි අංකය : පී වී 107183
ලියාපදිංචි ලිපිනය : අංක 216/3, නුවර පාර, දළුගම, කැලණිය
ලියාපදිංචි කළ දිනය : 2015 ජූලි 20

10-939

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාපනය කිරීම පිළිබඳ දැනුම් දීමයි.

| *සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි ලිපිනය* |
|---|---|---|---|
| සීනික් විලාස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 100229 | 2014.08.12 | අංක 256/19, නිව් සිටි ගාර්ඩන්ස්, වැලිවිට, කඩුවෙල |
| ඕෂන් යුරෝපා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | පී. වී. 99215 | 2014.06.19 | අංක 510, රෙක්ස් ඩයස් මාවත, උල්හිටියාව උතුර, වෙන්නප්පුව. |

සමාගම් ලේකම්.

10-814

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## පොලිස් නිල සුනඛයින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අයත් සේවයෙන් ඉවත් කළ නිල සුනඛයින් 07 දෙනෙකු 2015.10.31 වැනි දින පැය 09.00 ට මහනුවර, අස්ගිරිය පොලිස් නිල සුනඛ මූලස්ථානයේ දී වෙන්දේසි කරනු ලැබේ.

මෙම නිල සුනඛයින් එදින උදේ පැය 08.00 ට පරීක්ෂා කර බැලිය හැකි බව දක්වා සිටිමි.

| *අනු. අංකය* | *වර්ගය* | *පිරිමි* | *ගැහැණු* | *එකතුව* |
|---|---|---|---|---|
| 01. | ජර්මන් ෂෙපර්ඩ් | 03 | 01 | 04 |
| 02. | ලැබ්‍රඩෝර් රිට්රීවර් | 02 | - | 02 |
| 03. | ඇලස්කන් මැලමත් | - | 01 | 01 |
| | එකතුව | | | 07 |

එච්. එම්. සිසිර වීරකෝන් හේරත්,
පොලිස් අධිකාරි,
අධ්‍යක්ෂ.

2015 ඔක්තෝබර් මස 02 වැනි දින,
පොලිස් නිල සුනඛ කොට්ඨාසය,
අස්ගිරිය, මහනුවර.

10-765

---

HNB 136 - 11

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කඳාන ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කඳාන ප්‍රසිද්ධ නොතාරිස් කේ. එම්. එන්. පෙරේරා විසින් සහතික කරන ලද්දවූ ද හැටන් නැෂනල් බැන්ක් පී එල් සී නමට ලියන ලද්ද වූ ද 2007.03.20 දිනැති සහ අංක 400 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පෙරමුණ ගමගේ දොන් ශ්‍රීමාල් සම්පත් පෙරමුණ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2015ක් වූ නොවැම්බර් මස 27 වැනි දින පෙ. ව. 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-* බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කය තුළ ලියාපදිංචි වී ඇති අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ නිවන්දම ගමේ ලාවුලුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් 2002.10.20 වැනි දින සහ වඩා නිවැරදිව 2002.10.27 මැන සාදන ලද අංක 1792 දරන පිඹුර ප්‍රකාර බෙද වෙන් කරන ලද ලොට් 1 ඒ ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි සහ සියලු දේත් වේ. විශාලත්වය පර්චස් 39.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.03.18 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2011.03.29 වැනි දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - කොළඹ සිට මීගමුව මහා මාර්ගයේ ගමන් කොට කදාන නගරය පසුකොට කිලෝ මීටර 2.5ක් ගිය තැන ඇති වැලිගම්පිටිය හන්දියෙන් ගනේමුල්ල පාරට දකුණට හැරී කිලෝ මීටර් 3.5ක් ඉදිරියට යන්න. එතැන ආප්ප කඩේ හන්දියෙන් නිවන්දම පාරට වමට හැරී මීටර් 600ක් ඉදිරියට ගොස් මේ දේපළට ලඟාවිය හැකි ය.

කොළඹ සිට ඇති දුර කිලෝ මීටර් 23ක් පමණ වේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478.
ෆැක්ස් අංකය : 0112- 345975.

10-888

HNB 284-14 (1)

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - හෙට්ටිවීදිය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ලොලුව විසින් සහතික කරන ලද්දවූ ද හැටන් නැෂනල් බැන්ක් පී එල් සී නමට ලියන ලද්ද වූ ද 2010.12.29 දිනැති සහ අංක 2780 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පෙරියසාමි මහේෂ්වරන් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ දී 2015ක් වූ නොවැම්බර් මස 27 වැනි දින ප. ව. 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-* බස්නාහිර පළාතේ, (නමුත් කොළඹ ලියාපදිංචි කොට්ඨාසය තුළ) ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ වත්තල - මාබෝලේ නගර සභා සීමාව තුළ වසම් අංක 05, වත්තල, ගල්වැටිය පිහිටි ශ්‍රී වික්‍රම පටුමගේ වරිපනම් අංක 19 දරන කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද 2006 ජුනි මස 07 වැනි දින අංක 8992 දරන පිඹුර ප්‍රකාර බෙද වෙන් කරන ලද ලොට් එක්ස් දරන ඉඩම සමග ගොඩනැගිලි සහ එහි ඇති සියලු දේත්, විශාලත්වය පර්චස් දෙළහයි දශම නවයයි අට (අ. 0 රූ. 0 පර්. 12.98) වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014.09.05 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2014.09.12 වැනි දින ලක්බිම, තිනක්කුරල් සහ ඩේලිමිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - වත්තල, වෙලෙද පොල හන්දියෙන් ශ්‍රී වික්‍රම පාරට වමට හැරී මීටර් 500ක් පමණ ගමන් කොට වමට ඇති ශ්‍රී වික්‍රම පටු මගට හැරී මීටර් 100ක් ගිය විට අදාළ දේපළ වම් පැත්තේ වරිපනම් අංක 19 වශයෙන් හමු වේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු ,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනුවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

